**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ (කාර්යාංශය) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කාර්යාංශයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන් ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VIII වන පරිච්ඡේදයේ 42 වගන්තියේ (ආ), (ඉ) සහ (ඌ) උපවගන්ති | සංචාරක කර්මාන්තයේ ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදුකිරීමට වග බලාගැනීම සඳහා සැලසුම් කළ පොදු ප්‍රතිපත්තියක් ඇති කර ගැනීම, සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන ආදී වැඩසටහන්වල නිරත තැනැත්තන්ට සහ සංවිධානවලට වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන කාර්යාංශයට මඟපෙන්වීම ලබාදීම යන පරමාර්ථ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කාර්යාංශය විසින් ඉටුකර නොතිබුණි. | ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ දිරිගැන්වීමේ සංචාර සඳහා ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ සම්බන්ධීකරණ සහ සහයෝගී සංවර්ධනය සහ අලෙවිකරණය සහතික කිරීම සඳහා නිර්මාණය කර ඇති ඒකාබද්ධ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කටයුතු ආරම්භ කරමින් පවතී. | ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන කාර්යාංශයට මාර්ගෝපදේශ සැපයීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.36,103,317 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.95,382,436 ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.59,279,119 ක පිරිහීමක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාරයට ලබා දී ඇති දායකත්වය රු.20,000,000 කින් සහ අලෙවිකරණයට අදාළ වියදම් රු.173,957,668 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශයේ කාර්යාලය සඳහා වූ බදු ගිවිසුම 2022 දෙසැම්බර් 17 දිනෙන් අවසන් වී තිබුණි. කෙසේ වෙතත්, මෙම වසර තුළද බදු ගිවිසුම අලුත් කර නොතිබුණ අතර රු.151,250 බැගින් මාසික වාරික තුනක් සහ රු.267,000 බැගින් මාසික වාරික හතක් ලෙස එකතුව රු.2,322,750 ක් සමාලෝචිත වර්ෂය තුළ නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය විසින් වසර දෙකක් (2022 සහ 2023) සඳහා කුලී ගිවිසුම සමඟ අලුත් කිරීමේ ඉල්ලීම ඉදිරිපත් කර ඇත. මසකට කුලිය රු.110,000 සිට රු.267,000 දක්වා වැඩි කර ඇත. මෙයට මාසික විදුලිය සහ අනෙකුත් පහසුකම් සඳහා රු.42,000 ක් ඇතුළත් කර ඇත. මෙම වැඩි කළ කුලිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සම්මේලන | ඉඩම් සම්බන්ධ කාරණාව පැහැදිලි කරගෙන කාර්යාංශය ගිවිසුමට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| | කාර්යාංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර ඉඩමේ අයිතිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුව පවතින බැවින් ගිවිසුම අත්සන් කිරීමට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට නොහැකි වූ බව පැහැදිලි කර ඇත. එබැවින් ඉඩම් හිමියන්ගේ අනුමැතියකින් තොරව ගිවිසුමකට එළැඹීමට ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනයට බලය ලැබී තිබේද යන්න පැහැදිලි කිරීමකින් තොරව එය ප්‍රශ්නකාරීය. එබැවින්, ගිවිසුම අත්සන් කිරීමට පෙර, ඉහත සඳහන් කරුණු පිළිබඳව ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සිය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා ඇත. | |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමයට ලංසු කැඳවීමට අවස්ථාව තිබියදීත් කාර්යාංශයේ ලිපිනය යටතේ ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ ප්‍රදර්ශන හා උත්සව සංවිධායකයින්ගේ සංගමය (SLAPCEO) ශ්‍රී ලංකාවේ MICE ක්‍රියාත්මක කළ හැකි එකම වෘත්තීය සංවිධානය ලෙස ප්‍රකාශ කිරීමෙන් කාර්යාංශය නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කටයුතු කර ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද “MICE Expo Colombo” ප්‍රදර්ශනය, රු.48,084,013 ක වියදමින් එම ආයතනයට ප්‍රදානය කර තිබුණි. | SLAPCEO යනු කාර්යාංශයෙන් ස්වාධීන පුද්ගලික සංගමයකි. ඔවුන්ගේ ලිපිනය වෙනස් කරන ලෙස දැනුම් දීමට නිල ලිපියක් යවා ඇත. | ගනුදෙනු වල ලැදියාවන් අතර ගැටුම් වළක්වා ගැනීමටත්, අක්‍රමිකතා වළක්වා ගැනීම සඳහා හැකිතාක් තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියකට යාමටත් කටයුතු කළ යුතුය. |

### 3.3 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශය විසින් සංචාරක අමාත්‍යාංශයට අයත් 2019 වසරේ අනතුරට ලක් වූ CAU - 4004 අංක දරන ජීප් රථය අලුත්වැඩියා කිරීමේ පිරිවැය වෙනුවෙන් රක්ෂණ සමාගමෙන් ලැබුණු වන්දි මුදලට අමතරව ගෙවීමට නියමිතව තිබූ රු.11,516,808 ක මුදලක් 2023 නොවැම්බර් 23 වැනි දින ගෙවා තිබුණි. අදාළ වාහනය කාර්යාංශයට ලබා ගැනීමේ පදනම මත මෙම තීරණය ගෙන තිබූ | ආරම්භයේ සිටම, පවරන ලද නිල වාහනයක් නොමැතිකම හේතුවෙන් එවකට කාර්යාංශයේ සභාපතිවරයා දීමනා ලබාගැනීම තෝරාගෙන ඇත. සභාපතිවරයා ඔහුගේ අයිතිය ඉල්ලා සිටියද වාහනයක් මිලදී ගැනීමට ප්‍රතිපාදන නොතිබුණි. එම නිසා අමාත්‍යාංශය මෙම වාහනය පිළිබඳ දන්වා, අපේක්ෂිත අලුත්වැඩියා වියදම් පියවන ලෙස ඉල්ලා | මූල්‍යමය වශයෙන් වෙනත් ආයතනවල වත්කම් පරිහරණය නොකිරීමට කාර්යාංශය කටයුතු කළ යුතුය. |

නමුත් මේ සම්බන්ධයෙන් පූර්ව එකඟතාවක් හෝ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය මෙතෙක් නිසි ගිවිසුමකට එළඹ නොතිබුණු අතර අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2024 පෙබරවාරි 27 දිනැති අංක MT/ADM/01/22/2021/CAU-4004 දරන ලිපිය මගින් අදාළ ජීප් රථය වසර 05 ක කාලයක් භාවිතා කිරීම සඳහා කාර්යාංශය වෙත පවරා තිබුණි.

සිට ඇත. ඒ වෙනුවෙන් වාහනය වසර පහකට පවරන බව දැන්වීමෙන් පසු කාර්යාංශය වාහනය ලබාගෙන රු.මිලියන 11.5 ක හිඟ මුදල ගෙවා ඇත. පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයට අනුව රු.මිලියන 11.5 ක් ගෙවා වසර 5 ක් සඳහා වාහනය ලබා ගැනීම ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ සඳහා මූල්‍යමය ප්‍රතිලාභයක් වන අතර එමගින් දළ වශයෙන් රු.483,192 ක් ඉතිරි වේ. මෙහෙයුම් කල්බදු පදනම මත කාර්යාංශය සභාපතිවරයා සඳහා වාහනයක් වසර 5 ක කාලයක් සඳහා ලබාගෙන තිබේ නම්, කාර්යාංශය දැරිය යුතු පිරිවැය අවම වශයෙන් රු.මිලියන 12 (මාසයකට 200,000 x අවුරුදු 5) කි. කල්බදු පදනම මත වාහනයක් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ අනුමත උපරිම මාසික කුලිය රු.200,000 ක් වන අතර, මෙහෙයුම් කල්බදු වාහනකයක වර්තමාන වෙළඳපල මිල මසකට රු.250,000 කි. රු.250,000 කට පවා භාණ්ඩාගාරයෙන් නිකුත් කර ඇති පිරිවිතරයන්ට අනුව වෙළඳපොලේ වාහන නොමැත.

එබැවින් වසර 5 ක කාලයක් සඳහා මිලියන 11.5 කට වාහනය ලබා ගැනීම මූල්‍යමය වශයෙන් යෝග්‍ය වේ

## 3. 4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ (SOE) 3.4 ඡේදයට අනුව, සෑම රාජ්‍ය සතු ව්‍යවසායකම අනුප්‍රාප්තික සැලැස්මක් තිබීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, කාර්යාංශය මේ දක්වා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් අනුමත කරන ලද කාර්යාංශයේ බඳවා ගැනීමේ පටිපාටියට (SOR) අනුව, සියලුම බඳවා ගැනීම් සහ පුරප්පාඩු පිරවීම විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් සමඟ පුවත්පත් දැන්වීම මගින් සාමාන්‍ය ජනතාවගෙන් අයදුම්පත් කැඳවීමෙන් සිදු කෙරේ. එබැවින් කාර්යාංශයේ අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක කළ නොහැක. | කාර්යාංශය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායයන් සඳහා යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 ඡේදයට අනුව , වසර පහක කාලයක් සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. තවද, ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව සෑම වසරකම සැලැස්ම යාවත්කාලීන කළ යුතු අතර, ඊළඟ වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර, මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, කාර්යාංශය සඳහා උපායමාර්ගික සැලැස්මක් 2020-2023 දක්වා වර්ෂ හතරක් සඳහා සකස් කර තිබුණු අතර එය අද දක්වා යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරි පස් අවුරුදු කාලය සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට සහ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව වාර්ෂිකව යාවත්කාලීන කිරීමට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | උපායමාර්ගික සැලැස්ම වර්ෂ පහක කාලයක් සඳහා සකස් කළ යුතු අතර සෑම වර්ෂයකම යාවත්කාලීන කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. |